# හානිපූරණය සඳහා වන කාර්යාලය

## අරමුණු, බලතල සහ කාර්යයන්

අංක 408, ගාලු පාර, කොළඹ 03

# හානිපූරණය සඳහා වන කාර්යාලය

# ශ්‍රී ලංකාව

## අරමුණු, බලතල සහ කාර්යයන්

**හානිපූරණය සඳහා වන කාර්යාලය**
**අංක 408, ගාලු පාර, කොළඹ 03**

යාවත්කාලීන කරන ලද නව මුද්‍රණය - දෙසැම්බර්, 2021



## සභාපතිනියගේ පණිවිඩය

මෙය සංශෝධිත සහ යාවත්කාලීන කරන ලද ප්‍රශ්න හා පිළිතුරු අත් පොත වේ. 2021 මාර්තු මස දී ප්‍රශ්න හා පිළිතුරු අත් පොතෙ හි පළමු ප්‍රකාශනය නිකුත් කළ පසු ව සම්මත කරන ලද ප්‍රතිපත්ති පිළිබඳ විස්තර ඇතුළත් කරමින් මෙම අත් පොත යාවත්කාලීන කර නැවත මුද්‍රණය කිරීම අත්‍යාවශ්‍ය බව හැඟුණි.

ප්‍රශ්න හා පිළිතුරුවල අත් පොතෙ හි පළමු ප්‍රකාශනයේ සඳහන් පරිදි, 2018 අංක 34 දරණ හානිපූරණය සඳහා වන කාර්යාලය පනත පරිදි, පීඩාවට පත් තැනැත්තන් හට සහන ප්‍රදානය කිරීමේ නව දැක්ම පිළිබඳ ව දැනුම්වත් කිරීමේ අවශ්‍යතාවය හානිපූරණය සඳහා වන කාර්යාලයේ සාමාජිකයින් විසින් සැලකිල්ලට ගනු ලැබී ය. විශේෂයෙන් ම, හානිපූරණය සඳහා වන කාර්යාලයේ විෂය පථය, කාර්‍යභාරය සහ බලතල පිළිබඳ නිවැරදි තොරතුරු සමාජගත කිරීම මගින් සහන ලබා ගැනීමට අපේක්ෂා කරනු ලබන අයට, ඔවුන්ට ලබා ගත හැකි සහන පිළිබඳ පැහැදිළි අවබෝධයක් ලබා දීමේ වැදගත්කම පිළිගන්නා ලදී. එසේ ම අපගේ කාර්යයන් පිළිබඳ තොරතුරු අපේක්ෂා කරන වෙනත් පාර්ශ්වයන්ට ද පනතේ විධිවිධාන සරල ලෙස දැක්වෙන මෙවැනි අත් පොතක් මගින් දැනුවත් කිරීම වැදගත් කොට සලකන්නේ එමගින් පනතෙ හි විධිවිධාන දීර්ඝ නීතිමය විශ්ලේෂණයකට භාජනය කිරීමේ අවවශ්‍යතාවය ද අවම කරන නිසා වේ. ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කරනු ලබන හානිපූරණ සංකල්පය පිළිබඳ ව පැහැදිළි අවබෝධයක් ලබා ගැනීමට බලාපොරොත්තුවන්නන් හට මෙම අත් පොත ප්‍රයෝජනවත් වනු ඇතැයි මා විශ්වාස කරමි.

මෙමඟින් තොරතුරු ලබාදීමට අදහස් කරන්නේ විශේෂයෙන් ම සහන ලබා ගැනීමට අපේක්ෂා කරන තැනැත්තන්ට වන හෙයින් මෙකී කරුණු සඳහා දීර්ඝ ලෙස ව්‍යවස්ථාපිත අර්ථකථන ලබා දී◌මක් මඟින් අවශ්‍ය වනු ඇති සංකීර්ණතා මඟහරවා ගැනීම අරමුණු කරගෙන, මෙහි ඇති ප්‍රශ්න හා පිළිතුරු ඉතා සරලව දක්වා ඇත.

මෙම අත් පොතෙ හි පළමු මුද්‍රණය සඳහා සහාය ලබා දුන් ආකාරයට ම සංශෝධිත අත් පොත මුද්‍රණය කිරීම සඳහා ද මූල්‍යම ය බරපැන දැරූ සංක්‍රමණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය (IOM) ට ද නැවත වතාවක් මගේ කෘතඥතාවය පළකර සිටිමි. එකී දායකත්වය මෙම ප්‍රයත්නය සාර්ථක කර ගැනීමෙහිලා සුවිශේෂී උපකාරයක් වූ බව සඳහන් කළ යුතු ය.
හානිපූරණය සඳහා වන කාර්යාලය සම්බන්ධ වැඩිදුර තොරතුරු හා එහි කාර්යයන් මෙම කාර්යාලයේ වෙබ්අඩවිය ( www.reparations.gov.lk) ඔස්සේ ද ලබා ගත හැක.

**ධාරා විජයතිලක**

2021, දෙසැම්බර්

## හානිපූරණය සඳහා වන කාර්යාලයේ සාමාජිකයන්

**නීතිඥ ධාරා විජයතිලක මහත්මිය - සභාපතිනි**
ශ්‍රී ලංකා රාජ්‍ය සේවයේ වසර හතළිහකට අධික කාලයක් සේවය කර ඇති නීතිඥ ධාරා **විජයතිලක** මහත්මිය, අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරිය ලෙස 1994 දී පත්වීමත් සමඟ ම කැබිනට් අමාත්‍යාංශයක ලේකම්ධූරයකට පත් ප්‍රථම කාන්තාව ලෙස ගෞරවයට පාත්‍ර විය. එසේ ම, එතුමිය සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ හා විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ද ලේකම්වරිය ලෙස ද කටයුතු කර ඇත. තව ද, ධාරා විජයතිලක මහත්මිය ශ්‍රී ලංකා නීති කොමිසමෙ හි සාමාජිකාවක ලෙසත්, කාන්තාවන් පිළිබඳ වූ ජාතික කොමිසමෙ හි සාමාජිකාවක් ලෙසත් කටයුතු කර ඇත. රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැනීමත් සමඟ ම ඇය ලංකා වාණිජ මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරිණිය බවට පත් විය (2016 ජනවාරි - 2020). එසේ ම, **විජයතිලක** මහත්මිය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකාවක් ලෙස ද (2015 අප්‍රේල් - 2019) කටයුතු කළේ ය. එමෙන්ම, එතුමිය සම්පත් බැංකුවේ විධායක නො වන අධ්‍යක්ෂකවරියක් ලෙස ද, එහි නියෝජ්‍ය සභාපතිනිය ලෙස ද කටයුතු කර ඇත.

**නීතිඥ ආචාර්ය ජේ. එම්. ස්වාමිනාදන් මහතා - සාමාජික**
වෘත්තියෙන් නීතිඥයකු වන ආචාර්ය ස්වාමිනාදන් මහතා වසර 55 කට වඩා වැඩි කාලයක් එකී වෘත්තියෙ හි සේවය කර ඇති අතර, ශ්‍රී ලංකා නීති කොමිසමෙ හි ද, කොළඹ විශ්වවිද්‍යාල පාලක සභාවේ මෙන් ම නීති අධ්‍යාපන කවුන්සලයේ ද සේවය කර ඇත. එසේ ම, ආචාර්ය ස්වාමිනාදන් මහතා බුද්ධිමය දේපල පිළිබඳ ශ්‍රී ලංකා නීති උපදේශක කොමිසමෙ හි සාමාජිකයකු ලෙසත්, සමාගම් නීති උපදේශක කොමිසමේ සාමාජිකයකු ලෙසත් කටයුතු කර ඇති අතර, මේ වන විට රාජ්‍ය හා පෞද්ගලික සමාගම් කිහිපයක ම අධ්‍යක්ෂ මණ්ඩලයන් හි කටයුතු කරමින් සිටී. තව ද, ජූලියස් සහ ක්‍රිසි නීති සමාගමේ පූර්වගාමී කොටස්කරුවකු විය.

**ඒ.ඒ.එම්. ෆාතිහු මහතා - සාමාජික**
රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ හිටපු ප්‍රධාන තක්සේරුකරු වන ෆාතිහු මහතා ශ්‍රී ලංකා රාජ්‍ය සේවයේ වසර 40 කට වඩා වැඩි අත්දැකීම් ඇති නිලධාරියෙ කි. එසේ ම, එතුමා දැනට ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතනයේ සභාපති ලෙස ද කටයුතු කරමින් සිටී.

**සෙල්ලතම්බි සුමිත්‍රා මෙනවිය - සාමාජික**
වසර 10 කට අධික කාලයක සිට සුමිත්‍රා මෙනවිය නිදහස් උපදේශිකාවක්, මනෝ උපදේශිකාවක් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගැටළු, සංහිඳියාව හා ආබාධිතාව පිළිබඳ පර්යේෂිකාවක් ලෙස කටයුතු කරමින් සිටී. එසේ ම, දර්ශනය හා මනෝවිද්‍යාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ බාහිර කථිකාචාර්යවරියක් ලෙස කටයුතු කරන ඇය, සිවිල් සමාජ සංවිධාන අධ්‍යක්ෂක මණ්ඩලවල ද තනතුරු හොබවමින් සිටී.

**මේජර් ජනරාල් (විශ්‍රාමික) පාලිත ප්‍රනාන්දු මහතා - සාමාජික**
හිටපු හමුදා නිළධාරියෙකු වන **පාලිත** ප්‍රනාන්දු මහතා 2005 වසරේ දී මේජර් ජනරාල් ධූරයට උසස් කෙරුණු අතර 2015 වසර දක්වා ආරක්ෂක අමාත්‍යාංශයේ හමුදා සම්බන්ධතා නිළධාරීවරයා ලෙස කටයුතු කර ඇත. මේජර් ජනරාල් පාලිත ප්‍රනාන්දු මහතා දැනට වනජීවි හා වන සංරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ලෙස කටයුතු කටයුතු කරන අතර ශ්‍රී ලංකා මලල ක්‍රීඩා සංගමයේ සභාපති ලෙස ද කටයුතු කරමින් සිටී.

## අධ්‍යක්ෂ ජනරාල්

**නසීමා අහමඩ් මහත්මිය - අධ්‍යක්ෂ ජනරාල්**

නසීමා අහමඩ් මහත්මිය 2002 වසරේ දී තරඟ විභාගයක් සමත් වීමෙන් අනතුරු ව සහකාර අධ්‍යක්ෂවරියක් ලෙස පරිසර සහ ස්වාභාවික සම්පත් අමාත්‍යාංශයේ රාජකාරි කටයුතු ආරම්භ කරමින් රාජ්‍ය සේවයට ප්‍රවිෂ්ඨ වී ඇත. අමාත්‍යාංශ කිහිපයක ම අධ්‍යක්ෂවරියක් ලෙස රාජකාරි කටයුතු කර ඇති අහමඩ් මහත්මිය, කෙටි කලක් සඳහා ජාතික විද්‍යා පදනමෙ හි වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල්වරිය ලෙස ද කටයුතු කර ඇත. 2021 අගෝස්තු මස හානිපූරණය සඳහා වන කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්වරිය ලෙස රාජකාරි ආරම්භ කළ එතුමිය, මේ වන විට ජාතික විද්‍යා සහ තාක්ෂණ කොමිසමෙ හි වැඩ බලන ප්‍රධාන විධායක අධ්‍යක්ෂ ලෙස ද කටයුතු කරමින් සිටී. ඇය 2016 වසරේ දී ඕස්ට්‍රේලියානු ශිෂ්‍යත්ව තානාපති සම්මානලාභියා ලෙස ද කටයුතු කර ඇත.

# පටුන

1. හානිපූරණය සඳහා වන කාර්යාලය - අරමුණු, බලතල සහ කාර්යයන්............ 1

2.පීඩාවට පත් තැනැත්තන්.............................................................................. 3

3. හානිපූරණයන් ............................................................................... 5

4. සහන සඳහා අයදුම්පත ......................................................................... 9

# 1. හානිපූරණය සඳහා වන කාර්යාලය - අරමුණු, බලතල සහ කාර්යයන්

**1.1 හානිපූරණය සඳහා වන කාර්යාලය යනු කුමක් ද?**
හානිපූරණය සඳහා වන කාර්යාලය 2018 අංක 34 දරණ හානිපූරණය සඳහා වන කාර්යාලය පනත මඟින් පිහිටුවා ඇති අතර, එය 2018 ඔක්තෝබර් මස 22 වන දින සිට ක්‍රියාත්මක වේ. "හානිපූරණය" යනු "සහන" හෝ "පීඩා දුරු කිරීම සඳහා ප්‍රදානය කරන පිළියම්"වලට තවත් පදය කි.

රට තුළ සිදු වූ හෝ අනාගතයේ දී සිදු විය හැකි යම් යම් ගැටුම් හේතුවෙන් පීඩාවට පත් වූ හෝ පත් විය හැකි තැනැත්තන්ගේ අවශ්‍යතා සලකා බැලීමටත්, එවැනි තැනැත්තන් හට සහන ලබාදීම සඳහාත් රජය විසින් මෙම ආයතනය පිහිටුවා ඇත. එම ගැටුම් කුමන ඒවා ද යන්න මෙම අත් පොතෙ හි සවිස්තර ව පැහැදිළි කර ඇති අතර, එකී නිශ්චිත ගැටුම් මින් මතුව හඳුන්වනු ලබන්නේ "ගැටුම්" ලෙස ය.

**1.2 මෙම පනත සම්මත වී ඇත්තේ කුමක් අරමුණු කරගෙන ද?**
මෙම පනතෙ හි අරමුණ වන්නේ ගැටුමක් නිසා කිසියම් තැනැත්තෙකුගේ පවුලේ සාමාජිකයෙක් මිය ගියේ නම් හෝ අතුරුදහන් වූයේ නම් හෝ කිසියම් තැනැත්තෙකු තුවාල ලැබුවේ නම් හෝ ඔහුට/ඇයට අයිති දේපලවලට හානියක් සිදු වූයේ නම්, එසේ පීඩා විඳි තැනැත්තන්ට ඔවුන්ගේ ජීවිත නැවත ගොඩනංවා ගැනීමට හා ප්‍රතිෂ්ඨාපනය කිරීමට සහාය වීම යි.

හානිපූරණය සඳහා වන කාර්යාලය පනත මඟින් දක්වා ඇති පරිදි *"සියලු ශ්‍රී ලාංකිකයන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් ස්ථාවර වූ සඵලදායී ප්‍රතිකර්මයක් වශයෙන් පරිපූර්ණ හානිපූරණය කිරීමේ යෝජනා ක්‍රමයක් අනාගත පරපුර ඇතුළත් සියලු ශ්‍රී ලාංකිකයන්ගේ සුබසිද්ධිය සහ ආරක්ෂාව උදෙසා ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කිරීම සඳහා දායක වේ".*

**1.3 හානිපූරණය සඳහා වන කාර්යාලයේ සංයුතිය කුමක් ද?**
පනතේ විධිවිධාන අනුව, ව්‍යවස්ථාදායක සභාවේ (පසුව පාර්ලිමේන්තු කවුන්සලයේ) නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් සාමාජිකයින් පස් දෙනෙකු පත්කර, ඉන් එක් අයෙකු සභාපති ලෙස ද පත් කරනු ඇත. පනතෙ හි සඳහන් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සාමාජිකයන්ගේ වගකීම වේ. 2019 අප්‍රේල් මස ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් වසර තුනක කාලසීමාවක් සඳහා හානිපූරණය සඳහා වන කාර්යාලයේ ප්‍රථම සාමාජිකයින් පස් දෙනා පත් කරන ලදී.

අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා හානිපූරණය සඳහා වන කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල් ප්‍රමුඛ කාර්ය මණ්ඩලයක් ඇත. හානිපූරණය සඳහා වන කාර්යාලයේ කටයුතු පහසු කිරීම සඳහා ප්‍රාදේශීය කාර්යාල ද පිහිටුවිය හැකි ය. මේ වන විට එවැනි කාර්යාල පිහිටුවා නැති අතර දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන්ගේ සහාය ලබා ගෙන ඇත.

**1.4 හානිපූරණය සඳහා වන කාර්යාලය පනතෙහි ප්‍රධානත ම විශේෂාංග මොනවා ද?**
පිඩාවට පත් තැනැත්තෙකු යනු කවුරුන් ද, සහන ලෙස කුමන ආකාරයේ හානිපූරණයන් ප්‍රදානය කළ හැකි ද, සහ හානිපූරණයන් ප්‍රදානය කළ හැක්කේ කුමන ගැටුම් වර්ගවලින් පීඩාවට පත් වූවන් සම්බන්ධයෙන් ද යන කරුණු පනතෙ හි පැහැදිලි කර ඇත.

අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශයන්වලට අනුව තනි පුද්ගලයන්ට මෙන් ම පුද්ගල කණ්ඩායම්වලට ද (සාමූහික හානිපූරණයන්) හානිපූරණයන් ප්‍රදානය කිරීමට කටයුතු කළ යුතු බව පනතේ සඳහන් වේ. මේ සඳහා සාමාජිකයන් විසින් අදාළ පාර්ශ්වයන්ගෙන් තොරතුරු ලබා ගැනීමෙන් පසු ව ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශයන් සකස් කොට ඇති අතර, එකී ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශයන් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත. ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශයන් ගැන වැඩි විස්තර 3 වන ඡේදයේ සඳහන් කොට ඇත.

අතීත ගැටුම් හේතුවෙන් පීඩාවට පත් තැනැත්තන්ට පමණක් නො ව, අනාගතයේ දී සිදු විය හැකි ගැටුම් නිසා පීඩාවට පත් විය හැකි තැනැත්තන් සඳහා ද සහන ප්‍රදානය කිරීමට ද මෙම පනතේ විධිවිධාන ඇත.
හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් ගැටුම් හේතුවෙන් පීඩාවට පත් තැනැත්තන්ගේ අවශ්‍යතා සඳහා පමණක් පිළියම් ලබා දෙනු ලබන අතර, ස්වාභාවික විපත් හේතුවෙන් හෝ පෞද්ගලික ආරවුල් හේතුවෙන් ඇති වූ ගැටළු සඳහා පිළියම් ලබා නො දෙන බව මෙහි දී විශේෂයෙන් ම සඳහන් කළ යුතු ය. 2018 අංක 34 දරණ හානිපූරණය සඳහා වන කාර්යාලය පනත, මෙම කාර්යාලයේ වෙබ් අඩවියෙන්, (එනම් https://www.reparations.gov.lk ("පනත" යොමුව යටතේ) බාගත කරගත හැකි ය.

## 1.5 කිසියම් පුද්ගලයෙකුට අපරාධයක් සිදු වූ විට ඒ පිළිබඳ ව හානිපූරණය සඳහා වන කාර්යාලයට පැමිණිලි කළ හැකි ද?

ගැටුමක් සිදු වීමේ හේතුවෙන් පීඩාවට පත් වූ තැනැත්තන් හට හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් කළ හැකි වනුයේ ඔවුන්ගේ ජීවිත නැවත ගොඩනංවා ගැනීමට සහන ලබා දීම පමණක් වේ. සිදු වී ඇති අපරාධයක් සම්බන්ධයෙන් ඇති චෝදනාවක් පිළිබඳ ව විමර්ශනයක් පැවැත්වීමටවත්, යම් පුද්ගලයෙකුට විරුද්ධව අධිකරණයේ නඩු පැවරිය යුතු ද නැද්ද යන්න තීරණය කිරීමටවත් හානිපූරණය සඳහා වන කාර්යාලයට බලයක් නැත. අපරාධයක් පිළිබඳ විමර්ශනය කිරීමට නීත්‍යානුකූල බලය ඇත්තේ පොලීසියට වන අතර, ඒ සම්බන්ධයෙන් වන පැමිණිල්ල පොලීසියට ඉදිරිපත් කළ යුතු ය. ඒ අනුව, අපරාධයක් පිළිබඳව විමර්ශනය කිරීමට හෝ කිසිවකුට විරුද්ධව නඩු පැවරීමට හෝ දඬුවම් ලබා දීමට හෝ හානිපූරණය සඳහා වන කාර්යාලයට බලයක් නැත.

එසේ වුව ද යම් පුද්ගලයෙකු, ගැටුමක් නිසා ශාරීරික තුවාල ලැබුවේ නම් හෝ , මානසික පීඩාවට ලක් වූයේ නම් හෝ වෙනත් විධියකින් එම සිද්ධිය නිසා පිඩාවට පත් වූයේ නම්, සහන ලබා ගැනීම සඳහා හානිපූරණය සඳහා වන කාර්යාලයට ඉල්ලීමක් යොමු කළ හැකි ය. අදාළ ඉල්ලීම පරීක්ෂා කිරීමෙන් අනතුරු ව එම පුද්ගලයා පීඩාවට පත් තැනැත්තෙකු ලෙස හඳුනා ගන්නේ නම්, ඔහුගේ/ඇයගේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන ඔහුගේ/ඇයගේ ජීවිතය නැවත ගොඩනංවා ගත හැකි වන පරිදි අර්ථවත් හානිපූරණයන් ලබා දීම සළකා බලනු ඇත.

## 2. පීඩාවට පත් තැනැත්තන්

### 2.1 "පීඩාවට පත් තැනැත්තෙක්" යනු කවුරුන් ද?

පීඩාවට පත් තැනැත්තෙක් යනු පහත දක්වා ඇති ගැටුමක් සිදු වීම හේතුවෙන් "අහිමිවීමක් හෝ හානිවීමක්" නිසා පීඩා විඳින තැනැත්තෙක් වේ, එනම්-

අ. උතුරු සහ නැගෙනහිර පළාත්වල සිදු වූ සන්නද්ධ ගැටුම් හේතුවෙන් හෝ එහි පසු විපාකයක් ලෙස; හෝ
ආ. දේශපාලන නොසන්සුන්තාවයක් හේතුවෙන්; හෝ
ඇ. සිවිල් කැළඹීමක් හේතුවෙන්; හෝ
ඈ. බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමක් හේතුවෙන්.

''පීඩාවට පත් තැනැත්තෙක්'' යනු -

අ) ගැටුමක් සිදු වීම නිසා අහිමිවීමකින් හෝ හානිවීමකින් පීඩා විඳින තැනැත්තෙක්; හෝ
ආ) ගැටුමක් සිදු වීම නිසා යම් තැනැත්තෙකු මියගියේ නම් හෝ, බලහත්කාරයෙන් අතුරුදහන් වීමක් නිසා සොයාගත නො හැකි නම්, එකී පුද්ගලයාගේ පහත සඳහන් ඥාතීන් -
   i. කලත්‍රයා
   ii. දරුවන්
   iii. දෙමාපියන්
   iv. සහෝදරයා හෝ සහෝදරිය
   v. නැන්දණියන්/ මාමණ්ඩිවරු, මස්සිනාවරු/ නෑනාවරුන්, බෑණාවරුන්/ ලේලීවරුන්
   vi. මුණුබුරු මිණිබිරියන් සහ සීයලා සහ ආච්චිලා

### 2.2 ''අහිමිවීමක්'' හෝ ''හානිවීමක්'' යනු කුමක්ද?

ගැටුමක් නිසා යම් තැනැත්තෙකුහට (එනම් පීඩාවට පත් තැනැත්තෙකු හට) ''අහිමිවීමක්'' හෝ ''හානිවීමක්'' සිදු වී ඇති බවට සළකන්නේ, -

අ. එම තැනැත්තාගේ පවුලේ සාමාජිකයකු මරණයට පත්වූයේ නම්; හෝ
ආ. එම තැනැත්තාගේ පවුලේ සාමාජිකයකු අතුරුදහන් වී එම සාමාජිකයා නැවත කෙදිනක හෝ සොයා ගැනීමට නො හැකි වූයේ නම්, හෝ
ඇ. එම තැනැත්තාට ශාරීරික හෝ මානසික වශයෙන්, හානියක් හෝ තුවාලයක් සිදු වී ඇත්තේ නම්; හෝ
ඈ. එම තැනැතතාට අයත් චංචල හෝ නිශ්චල දේපල අහිමි වී ඇත්තතේ නම් හෝ එකී දේපල හානියට පත් වී ඇත්තේ නම්.

### 2.3 බලහත්කාරයෙන් සිදු කරන ලද අතුරුදහන්වීමක් යනු කුමක් ද?

බලහත්කාරයෙන් සිදු කරන ලද අතුරුදහන්වීමක් සිදු වන්නේ-

(අ) පහත සඳහන් තැනැත්තෙකු විසින්, එනම්
   i. යම් රජයේ නිලධාරියෙක් විසින් ; හෝ
   ii. රජයේ බලය පැවරීමක් මත ක්‍රියා කරන තැනැත්තෙකු විසින් ; හෝ
   iii. රජයේ බලය පැවරීම, සහාය සහ අනුදැනුම ඇති ව ක්‍රියා කරන තැනැත්තෙකු විසින්; හෝ
   iv. වෙනත් යම් තැනැත්තකු විසින් හෝ,

තවත් තැනැත්තෙකු සිරභාරයට ගන්නා, රඳවා තබා ගන්නා, අයුතු ලෙස සිරකර තබා ගන්නා, පැහැර ගෙන යන, අපහරණය කරන හෝ වෙනත් යම් ආකාරයකින් එම තැනැත්තාගේ නිදහස අහිමි කර; සහ

(ආ) එම නිදහස අහිමි කිරීම පිළිගැනීම ප්‍රතික්ෂේප කර; සහ

(ඇ) එවැනි යම් තැනැත්තකුගේ ඉරණම සඟවන හෝ, එම තැනැත්තා සිටින ස්ථානය හෙළිදරව් කිරීම ප්‍රතික්ෂේප කිරීමක්, කළ විට ය.

2018 අංක 5 දරණ *"බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත"* ශ්‍රී ලංකාව විසින් නීතිගත කර ඇති අතර, එමගින් "*බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම*" අපරාධයක් ලෙස හඳුන්වා ඇත. මෙම පනත පදනම් වී ඇත්තේ, 2010 දෙසැම්බර් 23 දිනැති ව බලාත්මක කරන ලද සහ 2016 මැයි 26 දිනැති ව ශ්‍රී ලංකාව විසින් අත්සන් කරන ලද එක්සත් ජාතීන්ගේ "බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය" මත වේ.

**2.4 පුද්ගලයන් කණ්ඩායමක් "පීඩාවට පත් තැනැත්තන්" ලෙස සැලකිය හැකි වන්නේ ද?**

**ඔව්**. ගැටුමක් නිසා යම් පුද්ගල කණ්ඩායමක් හෝ ප්‍රජාවක් සාමූහික වශයෙන් යම් අහිමිවීමකින් හෝ හානිවීමකින් පීඩාවට පත් ව ඇත් නම්, එකී කණ්ඩායම හෝ ප්‍රජාව පීඩාවට පත් තැනැත්තන් ලෙස සලකනු ලැබේ.

**2.5 ආරක්ෂක සේවාවල සාමාජිකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් "පීඩාවට පත් තැනැත්තන්" විය හැකි ද?**

**ඔව්**. මෙහි සඳහන් ගැටුමක් නිසා යම් අහිමිවීමකින් හෝ හානිවීමකින් පීඩා විඳින ඕනෑ ම ආරක්ෂක සේවයක සාමාජිකයෙකු හෝ ඔවුන්ගේ පවුලේ සාමාජිකයෙකු "පීඩාවට පත් තැනැත්තෙකු" ලෙස සලකනු ලැබේ.

**2.6 හානිපූරණයන් ලැබිය හැකි වන්නේ උතුරු හා නැගෙනහිර පළාත්වල ජීවත් වූ හෝ තවමත් ජීවත් වන තැනැත්තන්හට පමණක් ද?**

**නැත**. සහන ලබා ගත හැකි තැනැත්තන් හඳුනා ගැනීමට කිසිඳු භූගෝලීයමය නිර්ණායකයක් නොමැත. රටෙහි හඳුනා ගත් ප්‍රදේශයන් හි වෙසෙන තැනැත්තන්හට පමණක් හානිපූරණයන් ප්‍රදානය කළ යුතු බවට ද ස්ථාවරයක් නැත. යම් ගැටුමක් නිසා අහිමිවීමකින් හෝ හානිවීමකින් යම් තැනැත්තෙක් පීඩාවට පත් වී ඇත්නම්, ඔහු/ඇය රටෙහි කුමන ප්‍රදේශයක ජීවත්ව සිටිය ද හෝ ජීවත්වන්නේ ද, එකී තැනැත්තා හෝ ඔහුගේ/ඇයගේ ඥාතියා හානිපූරණයන් ලැබීම සඳහා සුදුසුකම් ලබයි.

හානිපූරණය සඳහා වන කාර්යාලය පනත මඟින් අපේක්ෂා කරන්නේ, රටෙ හි සෑම ප්‍රදේශයක ජීවත්වන පීඩාවට පත් ප්‍රජාවන් හා තැනැත්තන්හට සේවාවන් ලබා දීමයි.

**2.7. අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් පීඩාවට පත් තැනැත්තන් ලෙස සලකනු ලබන්නේ ද?**

**ඔව්**. යම් තැනැත්තෙකු මෙම අත් පොතෙහි 2.1 ඡේදයේ සඳහන් ගැටුමක් හේතුවෙන් අතුරුදහන් වී ඇත් නම්, (එම තැනැත්තාගේ ඉරණම සහ සිටින ස්ථානය පිළිබඳ නො දන්නේ නම්) එම තැනැත්තාගේ පවුලේ සාමාජිකයන් පීඩාවට පත් තැනැත්තන් වන අතර, ඔවුන් සහන සඳහා හිමිකම් ලබයි.

## 3. හානිපූරණයන්

### 3.1 "හානිපූරණයන්" යනු කුමක් ද?

"හානිපූරණයන්" යනු සහන හෝ "පීඩා දුරු කිරීම සඳහා ප්‍රදානය කරන පිළියම්" වලට තවත් පදයකි.

### 3.2 හානිපූරණයන් ප්‍රදානය කිරීම රජයේ නව වැඩපිළිවෙළක් ද?

**නැත.** තමන්හට පාලනය කළ නො හැකි හේතූන් නිසා, එනම් ගැටුම්කාරී අවස්ථා හෝ ස්වාභාවික විපත්වල ප්‍රතිඵලයක් හේතුවෙන් ඇතිවන අහිමිවීමක් හෝ හානිවීමක් නිසා පීඩාවට පත් තැනැත්තන්හට වන්දිමය ප්‍රදානයන් ලබා දීම රජය විසින් දීර්ඝ කාලයක් තිස්සේ පිළිගන්නා ලද සංකල්පය කි. වර්ෂ 1987 තරම් අතීතයේ දී, 1987 අංක 29 දරණ තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරී පනත මගින් වන්දි ප්‍රදානය කිරීමේ ප්‍රතිපත්තියට නෛතික පිළිගැනීමක් ලබා දී තිබුණි. එකී පනත **"රෙපියා පනත"** (REPPIA ACT) යන කෙටි නාමයෙන් හැඳින්වේ.

### 3.3 නව හානිපූරණ පනතක් අවශ්‍ය වුනේ ඇයි?

නව පනතක් අවශ්‍ය වූයේ පීඩාවට පත් තැනැත්තන්ගේ ජීවිත නැවත ගොඩ නැංවීමට වඩාත් අර්ථවත් අන්දමින් උපකාර කිරීමට අවධානය යොමු කිරීම සඳහා වේ. මෙම නව පනත මඟින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් මූල ධර්මයක් වන, සියලු ශ්‍රී ලාංකිකයන්ට ආවේණික ගරුත්වය සහ සමාන සහ අහිමි කළ නො හැකි මානව හිමිකම් සතු බවත් මේ හිමිකම් ගරු කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම රජයේ වගකීම බවත් පුනර්වචනය කරනු ලබයි.

රෙපියා පනතෙ හි අරමුණ වූයේ "කැරලි හෝ සිවිල් කෝලාහල" හේතුවෙන් විපතට පත් තැනැත්තන්හට වන්දි ප්‍රදානය කිරීම මඟින් ඔවුන් ව "පුනරුත්ථාපනය" කිරීමත්, එකී කැරලි හෝ කෝලාහල හේතුවෙන් විපතට පත් ඔවුන්ගේ දේපල නැවත අළුත්වැඩියා කිරීම සහ ප්‍රතිෂ්ඨාපනය කිරීම යි. නව හානිපූරණය සඳහා වන කාර්යාලය පනත මඟින් මූල්‍යම ය වන්දි ප්‍රදානයන්වලින් ඔබ්බට ගොස් පීඩාවට පත් තැනැත්තන්ට අර්ථවත් වෙනත් ආකාරයේ සහන ද ප්‍රදානය කිරීම ද අපේක්ෂා කරයි. මෙම පනත මඟින් මනෝසාමාජීය සහාය ලබා දීම සහ ප්‍රජාවන් වෙත විශාල පරාසයක් තුළ සහන ලබා දීම ඇතුළු ව නොයෙක් අයුරින් සහාය ලබා දීම අපේක්ෂා කරයි. පීඩාවට පත් තැනැත්තන්ගේ අවශ්‍යතාවන් තක්සේරු කරමින් ඔවුන් මුහුණපාන ලද සත්‍ය ගැටළුවලට ප්‍රතිචාර දැක්වීමත්, පීඩාවට පත් තැනැත්තන් හට ඔවුන්ගේ ජීවිත නැවත ගොඩනංවා ගැනීම හා ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා උපකාරී වන ආකාරයේ අර්ථවත් සහනයන් ලබා දීමත්, මෙම නව පනත මඟින් අපේක්ෂා කරයි.

විශේෂයෙන් ම, හානිපූරණයන් ප්‍රදානය කරනු ලබන්නේ ගැටුම්, සිවිල් කැළඹීම්, දේශපාලන නො සන්සුන්තාවයන් හේතුවෙන් පීඩාවිඳි තැනැත්තන් සහ බලහත්කාරයෙන් අතුරුදහන් කළ තැනැත්තන්ගේ පවුල් සඳහා වන අතර, ස්වාභාවික විපත් හෝ පෞද්ගලික ආරවුල් හේතුවෙන් පීඩාවට පත් තැනැත්තන් සඳහා නො වේ.

මේ අයුරින්, අතීතයේ සිදු වූ හෝ අනාගතයේ දී සිදුවිය හැකි ගැටුම් හේතුවෙන් පීඩාවට පත් තැනැත්තන් අතර සංහිඳියාව ඇති කිරීම සඳහා දායකත්වය ලබා දිය හැකි ආකාරයේ අර්ථවත් සහනයන් ලබා දීමේ මූලධර්මය මත මෙම පනත පදනම් වී ඇත.

**3.4 "හානිපූරණයන්" ලෙස ලබා දෙනු ලබන්නේ කුමන ආකාරයේ සහනයන් ද?**
හානිපූරණ පිළිබඳ ප්‍රතිපත්තිය යටතේ පහත ක්ෂේත්‍රයන්ට අදාළව හානිපූරණයන් ප්‍රදානය කරනු ලැබේ:

1. ජීවනෝපාය සහාය
2. වන්දි සහ මූල්‍යම ය සහාය
3. ඉඩම්වල අයිතිය නැවත පවරා දීම **සඳහා** සහාය
4. නිවාස පහසුකම් සැපයීම **සඳහා** සහාය
5. යටිතල පහසුකම් සංවර්ධනය **සඳහා** සහාය
6. පරිපාලනමය කටයුතු **සඳහා** සහාය
7. මනෝසාමාජීය **සඳහා** සහාය
8. ඒකීය බව, සංහිඳියාව සහ ප්‍රචණ්ඩත්වය නැවත ඇති නො වීම සඳහා පියවර ගැනීම

**3.5 හානිපූරණය සඳහා වන කාර්යාලයට ඉහත සහායන් සියල්ල ඍජුව ම ලබා දිය හැකි ද?**
අයදුම්කරුවන් හට මූල්‍යම ය වන්දි ලබා දීමේ දී හානිපූරණය සඳහා වන කාර්යාලය ඍජුව ම සම්බන්ධ වේ.
නමුත් ඇතැම් සහන ලබා දිය හැකි වන්නේ රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත මණ්ඩල මගින් දැනට පවතින සම්පත් භාවිත කිරීමෙන් පමණි. පීඩාවට පත් තැනැත්තන්ගේ අවශ්‍යතා හඳුනාගැනීමෙන් පසු ව ඔවුන්ට සහනයන් ලබා දීම සඳහා හානිපූරණය සඳහා වන කාර්යාලය, අදාළ රජයේ ආයතනයන් සමඟ සාකච්ඡා කරනු ඇත. තව ද, පුද්ගලයින් වෙත අවශ්‍ය සේවාවන් ලබාදීමට හැකියාවක් පවතින සිවිල් සමාජ සංවිධාන සමඟ ද එක් ව, හානිපූරණය සඳහා වන කාර්යාලය කටයුතු කරයි.

**3.6 හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් පීඩාවට පත් තැනැත්තන්හට අවශ්‍ය වන්නේ කුමක් ද යන්න හඳුනා ගන්නේ කෙසේ ද?**
ප්‍රතිපත්තියේ සඳහන් ක්ෂේත්‍රයන් හඳුනාගෙන ඇත්තේ පීඩාවට පත් තැනැත්තන්ගෙන් තොරතුරු විමසීමෙන් පසුව ය. මෙකී ක්ෂේත්‍ර යටතේ පීඩාවට පත් තැනැත්තන් හට ඉක්මනින් ම සහාය අවශ්‍ය බව හඳුනාගෙන ඇත. ඊට අමතර ව, හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් දිස්ත්‍රික්ක 25 හි ම දිස්ත්‍රික් ලේකම්වරුන් සමඟ සාකච්ඡා පවත්වා දැනට අවසන් කර ඇති වැඩසටහන්, දැනට ක්‍රියාත්මක වෙමින් පවතින වැඩසටහන් සහ පීඩාවට පත් තැනැත්තන් හට අවශ්‍ය වන වැඩසටහන් පිළිබඳ තොරතුරු එක් රැස් කර ගන්නා ලදී. පීඩාවට පත් තැනැත්තන්ගේ අවශ්‍යතා සම්බන්ධයෙන් වන තොරතුරු ඒ අයගෙන් නො කඩවා ලබා ගන්නා අතර, ඒවා පිළිබඳ ව සැලකිලිමත්වනු ඇත.

මනෝසාමාජීය සහාය සම්බන්ධයෙන් හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් පීඩාවට පත් තැනැත්තන් සමඟ කටයුතු කළ හැකි "සිද්ධි කළමනාකරුවන්" ලෙස හඳුන්වන විශේෂ නිලධාරීන් කණ්ඩායමක් පුහුණු කර ඇති අතර, අවශ්‍යතා මට්ටමේ යෝග්‍යතාවය මත රජයේ සේවාවන් සඳහා ප්‍රවේශ වීම සඳහා පීඩාවට පත් තැනැත්තන්ට සහාය වනු ඇත.

ජීවනෝපාය සහාය වැඩසටහන් සම්බන්ධයෙන් ස්වයං රැකියාවල නියැලීමේ කැමැත්තක් ඇති තැනැත්තන් හට හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් තාක්ෂණ දැනුම ඇතුළු වෙනත් අදාළ දැනුම වර්ධනය කිරීමේ වැඩසටහන් ද ක්‍රියාත්මක කරනු ඇත.

එමෙන් ම, අනෙකුත් සහාය ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ද, පීඩාවට පත් තැනැත්තන්ගේ අවශ්‍යතා හඳුනා ගැනීමෙන් අනතුරු ව රජය හා අනෙකුත් අදාළ ආයතන සමඟ සාකච්ඡා කිරීම සඳහා ද වැඩසටහන් පවත්වනු ඇත.

**3.7 හානිපූරණයන් තීරණය කිරීමේ දී භාවිත කරනු ලබන නිර්ණායක මොනවා ද?**

හානිපූරණයන් ප්‍රදානය කිරීමට තීරණය කිරීමේ දී හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් සකසන ලද හා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද පහත සඳහන් නිර්ණායක සැලකිල්ලට ගනු ඇත-

1. වින්දිත කේන්ද්‍රීයතාව - පීඩාවට පත් තැනැත්තන්ට වඩාත්ම අවශ්‍ය වේ යැයි සිතන දේ මත පදනම් ව තීරණ ගනු ඇත.
2. හානිපූරණයන් ලබා ගැනීම සම්බන්ධයෙන් වන සුදුසුකම මැන බැලීම සඳහා වන නිර්ණායක - විඳින ලද පීඩාවේ ස්වභාවය සහ බරපතළකම අනුව අදාළ නිර්ණායකයන්.
3. පීඩාවට පත් තැනැත්තන් වෙත හානිපූරණයන් ලබා දෙනු ලබන ආකාරය සහ අදාළ අවස්ථාවන්හි දී ඒවායෙ හි ප්‍රමාණය - සෑම විටම දෙනු ලබන සහනයන් කුමන ආකාරයේ සහන විය යුතු ද සහ මූල්‍යම ය වශයෙන් නම් ප්‍රදානය කළ යුතු මුදල් ප්‍රමාණය, පීඩාවට පත් තැනැත්තන්ගේ අවශ්‍යතා මත පදනම් වනු ඇත.
4. මූල්‍යම ය වන්දි සඳහා පීඩාවට පත් තැනත්තන්ගේ සුදුසුකම මැන බැලීම සඳහා වන නිර්ණායක - කුමන ආකාරයේ තැනැත්තන් මූල්‍යම ය වන්දි සඳහා සුදුසුකම් ලබයි ද, ඒ අයට කොපමණ මුදලක් ප්‍රදානය කරන්නේ ද යන්න තීරණය කිරීම සඳහා නිර්ණායක තීරණය කරනු ඇත.
5. නො පමාව ලබා දිය යුතු හානිපූරණය කුමන පීඩාවට පත් තැනැත්තනහට ප්‍රදානය කළ යුතු ද පිළිබඳ නිර්ණායක - ඇතැම් අවස්ථාවල දී පීඩාවට පත් තැනැත්තන් හට නො පමාව ලබා දිය යුතු මැදිහත්වීම් අවශ්‍ය වනු ඇති අතර, ඒවා පිළිබඳව ද සැලකිලිමත් වනු ඇත.
6. පීඩාවට පත් තැනැත්තන්ට විවිධ ආකාරයේ හානිපූරණයන් සැපයීම හෝ භාරදීම සඳහා සහාය විය හැකි ආයතන - හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් සහන සැපයීම සඳහා සම්බන්ධ කර ගත හැකි අනෙකුත් විශ්වාසනීය සංවිධාන හඳුනාගෙන ඒවා සමඟ කටයුතු කරනු ඇත.
7. හානිපූරණ සඳහා වන ඉල්ලීම් සඳහා ප්‍රමුඛතාවය ලබා දීමට පදනම් කරගත යුතු නිර්ණායක - පීඩාවට පත් තැනැත්තන් අතුරින් වඩාත් ම අනාරක්ෂිත පීඩාවට පත් තැනැත්තන් හඳුනා ගැනීම සඳහා ප්‍රමුඛතා ලැයිස්තුවක් සකසනු ඇත.
8. තත්‍යභාවය තහවුරු කිරීමේ නිර්ණායක - සහන ලබා ගන්නා තැනැත්තන් නීත්‍යානුකූල අයදුම්කරුවන් ද යන්න සහතික කරගැනීම වැදගත් වන අතර ඒ නිසා තත්‍යභාවය තහවුරු කිරීම සඳහා අවශ්‍ය වන ලේඛන මොනවා ද යන්න තීරණය කරනු ඇත.
9. මියගිය තැනැත්තන් අනුස්මරණය කිරීම හා ස්මාරක සඳහා වන නිර්ණායක - අනුස්මරණය කිරීම යනු මියගිය තැනැත්තන්ගේ පවුල්වල අයට ශෝක වීමට, මියගිය තැනැත්තන් අනුස්මරණයට සහ සිහිපත් කිරීමට ඇති චිත්තවේගීය අවශ්‍යතාව මිස මේ මඟින් ත්‍රස්තවාදීන් හෝ බෙදුම්වාදීන්ව අනුස්මරණය කිරීම අදහස් නො වේ.
10. පීඩාවට පත් විශේෂ කණ්ඩායම්වල විශේෂිත අවශ්‍යතා සඳහා අවධානය - ඇතැම් කණ්ඩායම්වලට ඔවුන්ගේ විශේෂ අවශ්‍යතා සපුරාලීම සඳහා විශේෂ සහාය ලබා දීම අවශ්‍ය වේ. එම නිසා මේ පිළිබඳව ද සැලකිලිමත් වනු ඇත. මෙම විශේෂ කණ්ඩායම් වන්නේ-
    a. කාන්තාවන්,
    b. දරුවන්,
    c. වැඩිහිටි පුද්ගලයන්,

d. ආබාධ සහිත තැනැත්තන් (රජයේ හමුදාවන් හි හා පොලීසියේ ආබාධිත තත්ත්වයට පත් වූවන් සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමෙන්තුවේ ආබාධිත තත්ත්වයට පත් වූ නිලධාරීන් ද ඇතුළු ව),
e. අවතැන් වූ පුද්ගලයින්,
f. අතුරුදහන් වූ/මියගිය තැනැත්තන්ගේ පවුල්වල සාමාජිකයන් (රජයේ හමුදාවන් හි, සහ පොලීසියේ සේවය කරන ලද හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ලෙස සේවය කරන ලද, ක්‍රියාන්විතයේ දී අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වල සාමාජිකයන් ද ඇතුළු ව)
g. ලිංගික හිංසනයන්ට ගොදුරුවූවන්,
h. හිටපු ළමා සොල්දාදුවන් ද ඇතුළු ව පුනරුත්ථාපනය කරන ලද හිටපු එල්.ටී.ටී.ඊ. සාමාජිකයන්.

## 4. සහන ලබා ගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීම

**4.1 හානිපූරණයන් ලබා ගැනීම සඳහා පීඩාවට පත් තැනැත්තෙක් විසින් සිදු කළ යුත්තේ කුමක් ද?**

<u>**වන්දි වෙනුවෙන් මුදල් අපේක්ෂා කරන්නේ නම්-**</u>

පීඩාවට පත් පුද්ගලයා විසින් අදාළ අයදුම් පත්‍රය සම්පූර්ණ කර, සිදු වූ හානිය තහවුරු කිරීම සඳහා අදාළ වන ලේඛන සමඟ එය අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා මෙම කාර්යාලයට ඉදරිපත් කළ යුතු ය. සිදු වූ හානිය තහවුරු කිරීම සඳහා ලියකියවිලි ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය වේ.

හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් එසේ ලැබෙන අයදුම්පත් සලකා බලා, එම අයදුම්කරු මුදලක් ලැබීමට සුදුසුකම් ලබන්නේ ද යන්න තීරණය කරනු ලැබේ. එසේ සුදුසුකම් ලබන්නේ නම්, කුමන ආකාරයේ සහනයන් ලබාදිය යුතු ද යන්න තීරණය කරනු ඇත.

දැනටමත් මූල්‍යමය වන්දි ලබා ඇති තැනත්තන් හට අනෙක් ආකාරයේ හානිපූරණයන් සඳහා ද ඉල්ලුම් කළ හැකි නමුත්, වැඩිදුර මූල්‍යමය වන්දි සඳහා ඔවුන් සුදුසුකම් නො ලබ යි.

<u>**වන්දි නො වන හානිපූරණයන් අපේක්ෂා කරන්නේ නම්-**</u>

මෙම කාර්යාලය විසින් පීඩාවට පත් තැනැත්තන්ගේ අවශ්‍යතා හඳුනා ගැනීමේ ක්‍රියාවලියෙන් පසු ඒ අය වෙනුවෙන් සුදුසු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

මීට අමතර ව, පීඩාවට පත් පුද්ගලයන්හට ද සිදු වූ හානිය හා පුද්ගලික අවශ්‍යතා සඳහන් කර, මෙම කාර්යාලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැක.

අයදුම්කරුවකු විසින් මීට පෙර යම් සහනයක් ලබා ඇත්නම්, එකී අයදුම්කරුගේ අවශ්‍යතා අනුව ඔහුට/ඇයට තවදුරටත් ලබා දිය යුතු සහන කවරේ ද යන්න සලකා බලනු ඇත.

**4.2 අයදුම් ඉදිරිපත් කිරීමට කාල සීමාවක් තිබේ ද?**

මූල්‍යමය වන්දි හැර, වෙනත් සහන ලබා ගැනීම සඳහා කාල සීමාවක් නැත.

මූල්‍යමය වන්දි සඳහා කාල සීමාවන් නියම කිරීමට අවශ්‍ය වේ. දීර්ඝ කාලයකට ප්‍රමාද කර ඇති අයදුම් සැළකිල්ලට භාජනය කළ හැකි වනුයේ ප්‍රමාදයට පිළිගත හැකි හේතූන් ඇත්නම් පමණක් වන අතර, එසේ කරනු ඇත්තේ සෑම අයදුමකට ම අදාළ කරුණු සැලකිල්ලට භාජනය කිරීමෙන් පසුව ය.

**4.3 සහන අපේක්ෂා කරන තැනැත්තෙකුට හානිපූරණය සඳහා වන කාර්යාලය ඉදිරියේ සාක්ෂි ලබා දීමට සිදු වේ ද?**

අයදුම්කරුවකු හෝ වෙනත් කිසිදු පුද්ගලයකු විසින් වාචික සාක්ෂි ලබා දීම අත්‍යාවශ්‍ය නො වේ.

**4.4 හානිපූරණය සඳහා වන කාර්යාලයට ලබා දෙනු ලබන තොරතුරුවල රහස්‍යභාවය සුරකින්නේ ද?**

**ඔව්.** පීඩාවට පත් තැනැත්තන් විසින් හානිපූරණය සඳහා වන කාර්යාලය වෙත ලබා දෙන සියළු ම තොරතුරුවල රහස්‍යභාවය සුරැකීම සඳහා නීතිමය වශයෙන් බැඳීමක් ඇත.

**4.5 හානිපූරණය සඳහා වන කාර්යාලය වෙත යම් අයෙක් අයදුම්පතක් ඉදිරිපත් කරන්නේ නම් හෝ හානිපූරණය සඳහා වන කාර්යාලය මඟින් යම් අයෙකුට හානිපූරණයන් ලැබී ඇත්නම් හෝ, එකී පුද්ගලයාට සිදු වූ අපරාධය සම්බන්ධයෙන් පොලීසියට හෝ වෙනත් අධිකාරියකට පැමිණිලි කිරීමට බාධාවක් තිබේ ද?**

**නැත.** එවැනි තැනැත්තෙක් හානිපූරණයන් ලබා ගැනීම සඳහා අයදුම්පතක් හානිපූරණය සඳහා වන කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබුණ ද, හානිපූරණයන් ලැබී තිබුණ ද, එම තැනැත්තාට හිමි අනෙකුත් ප්‍රතිකර්ම සහ සහන ලබා ගැනීම සඳහා අවශ්‍ය ලෙස කටයුතු කළ හැකි ය.

**4.6 යම් අයෙකුට පුනරුත්ථාපන අධිකාරිය (REPPIA) විසින් ලබා දුන් සහනයන් ලැබී ඇත්නම් එම පුද්ගලයාට හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් ලබාදෙනු ලබන හානිපූරණයන් ලබා ගත හැකි ද?**

**ඔව්.** පුනරුත්ථාපන අධිකාරිය මඟින් හෝ හානිපූරණය සඳහා වන කාර්යාලය මඟින් වන්දි ලැබී ඇතත්, වෙනත් සහායන් ලබා ගැනීම සඳහා අයදුම් කළ හැකි අතර දැනටමත් මූල්‍යම ය වන්දි ලබා ඇති තැනැත්තන් තවත් වන්දි මුදල් සඳහා සුදුසුකම් නො ලබ යි. හානිපූරණයන් ප්‍රදානය කිරීමේ දී, පීඩාවට පත් තැනැත්තන්හට පුනරුත්ථාපන අධිකාරිය හෝ හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් හෝ ලබාදෙනු ලැබූ මූල්‍යම ය වශයෙන් හෝ වෙනත් අයුරින් ලැබුණු සහනයන් සැලකිල්ලට ගනු ඇත.

**4.7 යම් අයෙකුට දැනටමත් හානිපූරණය සඳහා වන කාර්යාලයෙන් හානිපූරණයන් ලැබී ඇති නමුදු, එම පුද්ගලයා ඒ පිළිබඳව සෑහීමකට පත් නො වන්නේ නම් එම පුද්ගලයාට කුමන පියවරක් ගත හැකි ද?**

එවැනි තැනැත්තෙකුට හානිපූරණය සඳහා වන කාර්යාලය අමතා, ඔහුගේ/ඇයගේ අවශ්‍යතා සාකච්ඡා කළ හැකි ය. හානිපූරණය සඳහා වන කාර්යාලයේ දුරකථන අංක පහතින් දක්වා ඇත.

**4.8 හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයෙන් ලබා දෙනු ලබන නිර්දේශ පිළිගනු ලබන්නේ ද?**

**ඔව්.** අතරුදහන් වී ඇතැයි කියන ඕනෑ ම තැනැත්තෙකු සම්බන්ධයෙන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් නිර්දේශ ලබා දෙන්නේ නම්, හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් එම නිර්දේශ සැලකිල්ලට ගනු ඇති අතර, සුදුසු කටයුතු සඳහා අතුරුදහන් වූ තැනැත්තාගේ පවුලේ සාමාජිකයන්ව සම්බන්ධ කර ගනු ඇත.

**4.9 අයදුම්කරුවකුහට දැනටමත් යොමු කර ඇති අයදුම්පතක තත්ත්වය පිළිබඳව තොරතුරු ලබා ගත හැක්කේ කෙසේ ද?**

හානිපූරණය සඳහා වන කාර්යාලය වෙත පහත සඳහන් අංකවලින් අදාළ අංකයට දුරකථන ඇමතුමක් ලබා දී ඔහුගේ/ඇයගේ අයදුම්පතෙ හි තත්ත්වය පිළිබඳව තොරතුරු ලබා ගත හැකි ය. එනම්,

මරණ සහ තුවාල වන්දි හිමිකම් සම්බන්ධයෙන් - 0112575831

හානි වූ දේපල හිමිකම් සම්බන්ධයෙන් - 0112575818

**4.10 හානිපූරණ කාර්යාලය විසින් දියත් කරන වැඩසටහන් පිළිබඳ විස්තර ලබා ගන්නේ කෙසේ ද?**

වැඩසටහන් පිළිබඳ විස්තර හානිපූරණය සඳහා වන කාර්යාලයේ වෙබ්අඩවියෙ හි (www.reparations.gov.lk) ඇතුළත් කරනු ඇත.

ඊට අමතර ව, මෙම දුරකථන අංකයන් අමතා ද තොරතුරු ලබා ගත හැකි ය -0112575836 හෝ 0112575826

අවශ්‍ය විස්තර අදාළ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ද දැනුම්වත් කරනු ඇත.

හානිපූරණය සඳහා වන කාර්යාලය
අංක 408, ගාලු පාර, කොළඹ 03
දුරකථන : 0112-575803/ 0112-575813
විද්‍යුත් තැපෑල : info@reparations.gov.lk